# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,475 - 2026 පෙබරවාරි මස 06 සිකුරාදා - 2026.02.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 36 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 40 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 පෙබරවාරි මස 27 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 පෙබරවාරි මස 13 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

35 - B 082761 — - (2026/02)
C 1 -

# පිස්කල් විකිණීම්

## ගම්පහ දිසා අධිකරණයේ දී ය

### පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීම

බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමූපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියේ සංශෝධිත බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමූපකාර සමිති ප්‍රඥප්තිය අංක 59 (01) (ආ) සහ 59 (03) වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමයි.

ගම්පහ සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්,
වලව්වත්ත, කිඩගම්මුල්ල, ගම්පහ.

නඩු අංකය : 172/2024/විශේෂ
ස්වභාවය : විශේෂ
වටිනාකම : රු. 2,615,375/-
ඇස්කිසි අංකය : 40/2024

*................පෙත්සම්කරු.*

*එදිරිව*

1. ජයකොඩි ආරච්චිගේ දෝන දිල්හානි,
   අංක 181/සී/3, යායවත්ත, බොල්ලත, ගනේමුල්ල.

2. ජයකොඩි ආරච්චිගේ දොන් පීටර් විජේවර්ධන,
   අංක 181/සී/3, යායවත්ත, බොල්ලත, ගනේමුල්ල.

3. කාලිංග රංජනී,
   අංක 181/සී/3, යායවත්ත, බොල්ලත, ගනේමුල්ල

*..................වගඋත්තරකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ මෙම අධිකරණයේ 2024.05.21 දිනැති නියෝගය ප්‍රකාරව ඒකී නඩුවේ 01, 02, 03 වග උත්තරකරුවන්ගෙන් පෙත්සම්කරුට අයවීමට ඇති රුපියල් විසිහය ලක්ෂ පහළොස් දහස් තුන්සිය හැත්තෑ පහ (රු. 2,615,375/-) ක මුදල සහ ඒකී මුදල ගෙවා අවසන් වනතෙක් 2022.02.05 දින සිට මුල් මුදලට වාර්ෂිකව සියයට පහළොවක (15%) පොළියක් ද, ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් සහ ඒකී මුදල් නිසියාකාරව ගෙවා නොමැති බැවින් ඒකී මුදල මත නීතිමය පොළිය ද, නඩු ගාස්තු ද, ඇස්කිසි ගාස්තු සහ පිස්කල් ගාස්තු ද අයකර ගැනීම සඳහා වර්ෂ 2024.09.20 දින තහනමට ගන්නා ලද ඒකී නඩුවේ 01 වගඋත්තරකාරියට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපලෙහි ඔහුට අයත් සියලු අයිතිවාසිකම් හා හිමිකම් ද,

**වර්ෂ 2026 ක්වූ පෙබරවාරි මස 24 දින ප. ව. 2.30ට,**

එකී දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින්,

(i) ගැණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ක් ද,

(ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියට ප්‍රකාරව නියෝජ්‍ය පිස්කල්තැනගේ ගාස්තු ද,

(iii) විකුණුම් සඳහා වන සියලුම වියදම් ද, මුදලින් ගෙවිය යුතුය. තව ද, ගැනුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහක් වන (75%) ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත ඒකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොල්ලත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බොල්ලත ගමේ පිහිටි "දෙල්ගහවත්ත" නැමති ඉඩමට එස්. බී. ජයසේකර බ. මි. තැන විසින් මැන වර්ෂ 1995.10.09 දින මැන සාදන ලද අංක 9486 දරන පිඹුර ප්‍රකාර ලොට් 07 දරන කොටසට මායිම්, උතුරට : මෙහිම කැබලි අංක 08 සහ 10 ද, නැගෙනහිරට : මෙහිම කැබලි අංක 06 ද, දකුණට : විල්ෆ්‍රඩ් වේරගොඩගේ ඉඩම ද, බස්නාහිරට : ඩබ්ලිව්. එස්. පෙරේරාගේ ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් ඒකොළහයි දශම හයයි අට (පර්. 11.68) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පලතුරු ආදී සියලු දේත් වේ.

*මාර්ග අයිතිය.-*

ඉහත කී අංක 9486 දරන සැලැස්මේ පෙන්වා ඇති කැබලි අංක 10 දරන බිම් කොටසට මායිම් : උතුරට : කැබලි අංක 02, 05 සහ 04 ද, ඒස්. නානායක්කාර සහ තව අයට අයිති ඉඩම ද, නැගෙනහිරට : කැබලි අංක 02, 05 සහ කරුණාරත්නට අයිති ඉඩම සහ පාර ද, දකුණට : කැබලි අංක 06 සහ 07 ද, බස්නාහිරට : කැබලි අංක 09, 08, 04, 03 සහ 01 ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දොලහයි දශම හතර (12.04) ක් විශාල ඉඩම තුළ පිහිටි සියලුම ආකාරයේ වන පොදු මාර්ග අයිතිය ද සමග වේ.

තව ද, ඒකී ඉඩමට ප්‍රවිශ්ය වීම සඳහා ඒකී සැලැස්මේ පෙන්වා ඇති සියලුම මාර්ග ප්‍රවේශ අයිතීන් ද ප්‍රාදේශීය සභා පාරේ සිට ඉඩමට ප්‍රවිෂ්ය වීම සඳහා ඇති සියලුම මාර්ග අයිතීන් ද සමග වේ.

එම්. එස්. චාමණී,<br>
රෙජිස්ට්‍රාර්/ පිස්කල්,<br>
දිසා අධිකරණය,<br>
ගම්පහ.

වර්ෂ 2026 ක් වූ ජනවාරි මස 09 දින දී ය.

02-27

---

**මීගමුව දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

ද ක්‍රෙඩිට් ක්ලබ් (ප්‍රයිවට්) ලිමිටඩ්,<br>
අංක 515/8/A, පිංකෝවත්ත,<br>
දළුපොත, මීගමුව.

නඩු අංකය : 4043/MB<br>
ස්වභාවය : උගස්<br>
කාර්ය පටිපාටිය : සාමාන්‍ය<br>
ඇස්කීසි අංකය : 49/2024

............*පැමිණිලිකරු.*

*එදිරිව*

ස්ටලා ශිරෝමනී කොස්තා,<br>
අංක 70/බී,<br>
කනත්ත පාර, ඒත්තුකාල,<br>
මීගමුව.

..............*විත්තිකාරිය.*

ඉහත අංකය දරන නඩුවේ වර්ෂ 2023 ක් වූ ජනවාරි මස 12 දින දරන සමථ තීන්දු ප්‍රකාශය දරන සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව, විත්තිකාරියගෙන් පැමිණිලිකාර සමාගම වෙත අයකර ගන්නට කියා නියම කොට තීන්දු ප්‍රකාශය කරන ලද රුපියල් පනස් හතර ලක්ෂ හැත්තෑහත් දහස් එකසිය අටයි ශත තිස් හතක (රු. 54,77,108.37/-) මුදලින් රුපියල් තිස්නම ලක්ෂ තිස්තුන් දහස් ඒකසිය අටයි ශත තිස්හතක (රු. 3,933,108.37/-) ක මුදලක් මේ දක්වා ඉහත නම සඳහන් විත්තිකාරිය විසින් ගෙවා නොමැති බැවින් මෙම

නඩුවේ ඇස්කීසි ක්‍රියාවේ යෙදවීමේ බලපත්‍රයක් නිකුත් කර අධිකරණයෙන් නැවත වැඩිදුරටත් ආඥාවක් ලැබෙන තෙක් මෙයට යා කොට ඇති උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ යම් ලෙසකින් පැවරීම, අන්සතු කිරීම හෝ වැය බරකට යටත් කිරීම ඒ සම්බන්ධයෙන් යම් ලේඛන ඉදිරිපත් කිරීම හෝ ලියාපදිංචි කිරීම හෝ උපදෙස් දීම එකී විත්තිකරුහට තහනම් කර එයින් වලක්වන ලද හෙයින් සහ එයින් හෝ ඉන් කොටසක් මුදලට හෝ ත්‍යාග වශයෙන් අන් ක්‍රමයකට ලබා ගැනීම සියල්ලන්ටම තහනම් කරන ලද හෙයින්,

**වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 26 දින ප. ව. 2.00 ට**

එකී දේපළ පිහිටි ස්ථානයේ දී පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුළු ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද, පිස්කල් ගාස්තු ද, රජයට අයවිය යුතු ගාස්තු, වෙන්දේසි ගාස්තු *ගැසට් පත්‍රයේ* ගාස්තු සහ පුවත්පත් වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වියදම් ද ඒවෙලේම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් 75% ඉතිරි මුදල දින 30ක් ඇතුළත මීගමුව දිසා අධිකරණයේ ඉහත කී අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, අලුත්කුරු කෝරළයේ, දූනගහ පත්තුවේ, මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ, මීගමුව මහ නගර සභා සීමාව තුළ අංක 73 ඒත්තුකාල ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත් ඒත්තුකාල පිහිටි කනත්ත පාරේ, වරිපනම් අංක 70 බී දරන නවරත්තඩි තෝට්ටම් නම් වූ ඉඩමට ටී. සී. එස්. ප්‍රනාන්දු බලයලත් මිනින්දෝරු තැන විසින් 1977.01.14 දින මැන සාදන ලද අංක 11/1977 සහ 1977 දරන පිඹුර ප්‍රකාර එකී පිඹුරේ නිරූපිත ඉඩම් කොටසට මායිම් : එනම් උතුරට : එකී මිනින්දෝරු තැනගේ 1976.05.26 දින දරන අංක 78/76 දරන පිඹුරේ අංක 02 දරන කොටස ද, නැගෙනහිරට : ලූසියා මිරාන්ඩුට අයිති අංක 04 දරන කොටස ද, දකුණට : ඇලිස් මිරාල්ට අයිති ඉඩම ද, බස්නාහිරට : පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම පහක් (පර්. 12.5) විශාල ඉඩම සහ ඊට අයිති ගහකොළ, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

අධිකරණයේ අණ පරිදි,

රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මීගමුව.

වර්ෂ 2026 ක් වූ ජනවාරි මස 08 දින දී ය.

02-38

---

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

නඩු අංකය : DDR/138/16
කාර්ය පටිපාටිය : ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ නියමිත විශේෂ
ස්වභාවය : ණය ආපසු අයකර ගැනීම
වටිනාකම : රු. 2,345,531/01
ඇස්කීසි අංකය : 60

1994 අංක 9 දරන පනතෙන් සංශෝධිත පරිදි 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4(1) වගන්තිය යටතේ පවරන ලද නඩුකරය.

අබාන්ස් ෆිනෑන්ස් පී.ඒල්.සී.
අංක 400, ගාලු පාර, කොළඹ 03.

*සහ, දැන්,*

456, ආර්. ඒ. ඩී. මෙල් මාවත, කොළඹ 03.
(සමාගමේ නව අංකය - පී. බී. 1015 පී. ක්‍යු)

*............පැමිණිලිකරු.*

*එදිරිව*

1. තල්පිටියේ ගෙදර කරුණාරත්න,
"සෙත්සිරිපාය", රුවන්පුර, උඩුමුල්ල, මාවනැල්ල.

*............ 1 විත්තිකරු.*
*(මියගොස්)*

1. (අ) රන්දුනු පේඩිගෙදර චන්ද්‍රානි,
රුවන්පුර, උඩුමුල්ල, මාවනැල්ල.

*............ ආදේශිත 1 විත්තිකාරිය.*

2. මොහොමඩ් සරිෆ් හමීර් අම්සා මොහොමඩ් හසරාවුෆ්,
අංක 12, තැන්නකුඹුර, මහනුවර.

*........... 2 විත්තිකරු.*

3. තල්පිටියේ ගෙදර චතුර බුද්ධික ජනරංජන කරුණාරත්න,
රුවන්පුර, උඩුමුල්ල, මාවනැල්ල.

*............ 3 විත්තිකරු.*

වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 07 දින කොළඹ අතිරේක දිසා විනිසුරු ගරු අමාලි රණවීර මැතිණිය ඉදිරිපිට මෙම නඩුව සුදුස්සක් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබ, පැමිණිල්ල සහ ලේඛන කියවා බැලීමෙන් ද, ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේ අඩංගු සම්ප්‍රකාශ ගැන සෑහීමට පත්වීමෙන් ද, පසු ආඥා කර තීන්දු ප්‍රකාශ කරන වගනම් රුපියල් 2,345,531.01 ක මුදලක් සහ රුපියල් 2,220,166.92 ක මුදලක් මත වර්ෂ 2015 ක් වූ දෙසැම්බර් මස 15 දින සිට තීන්දු ප්‍රකාශ දින දක්වා වර්ෂයකට 27% බැගින් පොළිය ද, ඊට පසු මෙකී දිනයේ සිට මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් එම අනුපාතිකය මත පොළිය ද, නඩු ගාස්තු ද, විත්තිකරුවන් විසින් එක්ව සහ හෝ වෙන් වෙන්ව පැමිණිලිකරුට ගෙවිය යුතු බව ය.

ඉහත නම් සඳහන් විත්තිකරුවන්ගේ ගෙවල්, ඉඩම්, බඩු, ණය සහ අයවිය යුතු ණය තහනමට ගෙන අවශ්‍ය නම් ඒවා විකිණීමෙන් අධිකරණයේ මේ තීන්දු ප්‍රකාශය මගින් එකී විත්තිකරුවන්ට විරුද්ධව එක්ව සහ හෝ වෙන් වෙන්ව පැමිණිලිකරු විසින් අයකර ගැනීමට ඇති රුපියල් 2,345,531/01 ක මුදලක් සහ රුපියල් 2,220,166/92 ක මුදලක් මත වර්ෂ 2015 ක් වූ දෙසැම්බර් මස 15 දින සිට තීන්දු ප්‍රකාශය දින දක්වා වර්ෂයකට 27% බැගින් පොළිය ද, ඊට පසු මෙකී දින සිට මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් එම අනුපාතිකය මතම පොළිය ද, ලබා ගන්නා ලෙස ද, මේ නෛසයි තීන්දු ප්‍රකාශය නියත බවට පත් කිරීමෙන් දින තිහක් ඇතුළත හෝ මේ අධිකරණය විසින් ඉඩ දෙන යම් දීර්ඝ කරන කාලයක් ඇතුළත ඒ මුදල මේ අධිකරණය ඉදිරියට ගෙනෙන ලෙස ද බස්නාහිර පළාතේ පිස්කල් විසින් ඒ දේපළ විකිණූ මුදල හෝ මුදල් තැනැත්තා හෝ තැනැත්තන් පිළිවෙලින් මේ අධිකරණයට දන්වන ලෙස ද, බස්නාහිර පළාතේ පිස්කල්ට මෙයින් අණ කරනු ලැබේ. මේ නෛසයි තීන්දු ප්‍රකාශය නියත බවට පත් කළ පසු එය එම කාර්යය සඳහා අණ පත්‍රයක් ලෙස ක්‍රියාත්මක විය යුතු බවට ද, නියෝග කර ඇති බැවින් ද, එකී නියත තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුට ගෙවීම් කිරීමට ඉහත නම් සඳහන් විත්තිකරුවන් අපොහොසත් වී ඇති හෙයින්,

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට 1 (අ) සහ 02, 03 විත්තිකරුවන් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් 1 විත්තිකරු (මියගොස්) ආදේශිත 1 (අ) විත්තිකාරියට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 26 දින ප. ව. 1.00 ට,**

ඉහත නම් සඳහන් 1 විත්තිකරු (මියගොස්) ආදේශිත 1 (අ) විත්තිකාරියගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

## උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත්, මාවනැල්ල ප්‍රාදේශීය සභා සීමාවේ ගල්බොඩ කෝරළේ, ගම් නමය පත්තුවේ හීනැටිපොත ග්‍රාමසේවා වසමේ හීනැටිපොත ග්‍රාමයේ මිකනුමැදහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඩී. සිරිසුරෝය විසින් වර්ෂ 1995 ක් වූ ජනවාරි මස 07 දින මැන බෙදා වෙන්කළ පිඹුරුපත් අංක 563 හි කැබලි

අංක 2 ලෙස සලකුණු කරන ලද ඉඩමට මායිම් : උතුරට : ගනේතැන්න සිට හීනටිපාන දක්වා ඇති ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : දාදු ඇළ ද, දකුණට : ගඩාදෙස්ස ඔය ද, බටහිරට : ඒ. පී. පැලිස් මහතා විසින් හිමිකම් කියනු ලබන මිකනුමැදගේන ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහනමයකින් (පර්. 19) යුත් ඉඩම හා ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පලතුරු ආදී සෑම සියලු දේ ද වේ.

මෙම ඉඩම කෑගල්ල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ H 50/02 හා ලියාපදිංචි කර ඇත.

*ගෙවීමේ ක්‍රමය :*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතු ය.
සියලු ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

01. සම්පූර්ණ ගැණුම් මුදලින් 25% එම ස්ථානයේ දී ම ගෙවිය යුතු ය.
02. ඉතිරි 75% ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළව අධිකරණයේ තැන්පත් කළ යුතුය.
03. රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතුය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මාවනැල්ල.

වර්ෂ 2026 ක් වූ ජනවාරි මස 19 දින දී ය.

02-48

---

# විවිධ දැන්වීම්

**පෙත්සම අවසන් කිරීමේ දැන්වීම**

කොළඹ ස්ථාපිත (වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන) බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය

VIS BROADCASTING (PRIVATE) LIMITED,

නඩු අංකය : CHC/93/2024/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම
ක්‍රියා පටිපාටිය : ලඝු

ගණන් බේරා වසා දැමීම සඳහා වූ කාරණය.

Innovative Production Group FZ LLC,
Fujairah - Creative Tower,
P. O. Box 4422, Fujairaah,
United Arab Emirates.

*............පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් VIS BROADCASTING (PRIVATE) LIMITED සහ සමාගම (පීවී 63832) සම්බන්ධව ගණන් බේරා වසා දැමීම සම්බන්ධව වූ පෙත්සමට අදාළ පටිපාටිකරය කොළඹ ස්ථාපිත සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාත් ගරු මහාධිකරණය විසින් 2025 දෙසැම්බර් 19 දින අවසන් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව, මෙම නිවේදනය මගින් ඉහත නඩු අංක CHC/93/2024/CO ට අදාළ පටිපාටිකරය අවසන් කළ බව දැනුම් දෙනු ලැබේ.

එන්. ඇන්ඩ් එස්. ඇසෝසියේට්ස්,
nandsv3@gmail.com
අංක 152-1/2, අලුත්කඩේ (Hulftsdorp) වීදිය,
කොළඹ 12.
(පෙත්සම්කරු සඳහා ලියාපදිංචි නීතිඥයන්)

02-35

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2026 වර්ෂය** | | | |
| **පෙබරවාරි** | 2026.02.06 | සිකුරාදා | 2026.01.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.02.13 | සිකුරාදා | 2026.01.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.02.20 | සිකුරාදා | 2026.02.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.02.27 | සිකුරාදා | 2026.02.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2026.03.06 | සිකුරාදා | 2026.02.20 | සිකුරාදා | දහවල් | 03.00 |
| | 2026.03.13 | සිකුරාදා | 2026.02.27 | සිකුරාදා | දහවල් | 03.00 |
| | 2026.03.20 | සිකුරාදා | 2026.03.06 | සිකුරාදා | දහවල් | 03.00 |
| | 2026.03.27 | සිකුරාදා | 2026.03.13 | සිකුරාදා | දහවල් | 03.00 |
| **අප්‍රේල්** | 2026.04.02 | බ්‍රහස්පතින්දා | 2025.03.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.04.10 | සිකුරාදා | 2025.03.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.04.17 | සිකුරාදා | 2026.04.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.04.24 | සිකුරාදා | 2026.04.10 | සිකුරාදා | දහවල් | 12.00 |

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ.බ.)*

2026 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.